**unit 12**

# ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමය

වාගීෂ්වර

- ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමය හැඳින්වීම.
- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය
- සන්ධීය ක්‍රමය
- පක්ෂ ක්‍රමය

**s u r e k a   w a g e e s h w a r a**

# ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමය හැඳින්වීම

## ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමය හැඳින්වීම. (ලක්‍ෂණ)

"නියම ප්‍රජාතන්ත්‍රවාදී රටවල් වන නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය අතර අධ්‍යයන කළ යුතු රාජ්‍යයක් ලෙස උපරිම වශයෙන් හිමිකම් ලබනුයේ ස්විට්සර්ලන්තයයි."

බ්‍රයිස්
-නූතන ප්‍රජාතන්ත්‍රවාදය-

### 1. ලිඛිත ආණ්ඩුක්‍රමයක් වීම.

(**N.B** ලිඛිත ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න.)

ස්විට්සර්ලන්තය ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පවතින රාජ්‍යයකි. වර්තමානයේ පවතින ව්‍යවස්ථාව 1848 සිට ක්‍රියාත්මක වේ. එය 1874 දී සංශෝධනය කරන ලදි. 1998 දී නව ව්‍යවස්ථාවක් සම්මත කළ අතර එය 1999 දී ජනමත විචාරණයක දී සම්මත විය. 2000 වසරේ සිට ක්‍රියාත්මක ක්‍රියාත්මක වන්නේ එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. එය පරිච්ඡේද **VI** සහ වගන්ති 197 කින් සමන්විත වේ.

### 2. අනම්‍ය ආණ්ඩුක්‍රමයක් වීම.

(**N.B** අනම්‍ය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න)

ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය ව්‍යවස්ථාවකි. එය අර්ධ වශයෙන් හෝ පූර්ණ වශයෙන් සංශෝධනය කිරීම සඳහා භාවිතා කරන ක්‍රම දෙකකි.

**I ක්‍රමය.**

**ව්‍යවස්ථාදායකය එනම්, සංඝීය මහා මණ්ඩලය ගෙන එන යෝජනාවක් අනුව.**

සංඝීය මහා මණ්ඩලයේ මණ්ඩල දෙකේම එකඟතාවය මත ගෙන එන ව්‍යවස්ථා සංශෝධන යෝජනාවක් කෙටුම්පතක් කොට ජනතාවගේ (ජනමත විචාරණයක්) හා කැන්ටන වල ඡන්දවිමසීමක් සඳහා ඉදිරිපත් කළ හැකියි. ජනමත විචාරණයක දී ජනතාවගේ බහුතර අනුමැතියත් කැන්ටන වල ඡන්ද විමසීමේ දී කැන්ටන වල බහුතර අනුමැතියක් ලැබේනම් එම ව්‍යවස්ථා සංශෝධනය සිදුවේ. **නමුත්** සංඝීය මහා මණ්ඩලයේ මණ්ඩල දෙකෙන් එක් (01) මණ්ඩලයක් ව්‍යවස්ථා සංශෝධන යෝජනාවට එකඟ නොවන්නේ නම් යෝජිත සංශෝධනය අවශ්‍ය ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා ඡන්ද විමසීමක් පවත්වයි. ජනතාව බහුතරය එම යෝජිත සංශෝධනයට එකඟවන්නේ නම් සංඝීය මහා මණ්ඩලය විසුරුවා හැර නව සංඝීය මහා මණ්ඩලයක් තෝරාපත් කොට ගනී.එම නව සංඝීය මහා මණ්ඩලය යෝජිත සංශෝධනය සාකච්ඡාවට ලක් කරයි. එම නව සංඝීය මහා මණ්ඩලයේ මණ්ඩල දෙකම එම සංශෝධන යෝජනාවට එකඟ නම් එය ජනතාවගේ හා කැන්ටන් වල ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් කරයි. ජනමතවිචාරණයක දී ජනතාවගෙන් බහුතරය ද කැන්ටන් වල ඡන්ද විමසීමේ දී කැන්ට බහුතරයක් ද එම සංශෝධන යෝජනාව අනුමත කරන්නේ නම් සංශෝධන යෝජනාව සම්මත වේ.

**II ක්‍රමය.**

ව්‍යවස්ථානුකූල ප්‍රාරම්භයක් අනුව.

ජනතාව ලක්ෂයක් (100,000) විසින් අත්සන් කරමින් ඉදිරිපත් කරන ලද ප්‍රාරම්භන යෝජනාවක් මගින් ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍ය යැයි ජනතාවට ඉල්ලීම් කළ හැකිය. එවැනි යෝජනාවක් ඉදිරිපත් වූ විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විය යුතු දැයි ජනතාවගෙන් ප්‍රශ්න කරමින් ජනමත විචාරණයක් පවත්වයි. ජනතාවගෙන් බහුතරයක් ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍යයැයි ප්‍රකාශ කළ හොත් සංධීය මහා මණ්ඩලය විසුරුවා හැර නව සංධීය මහා මණ්ඩලයක් තෝරා පත් කර ගනී. එම නව සංධීය මහා මණ්ඩලයේ මණ්ඩල දෙකේම අනුමැතිය මගින් ජනතාවගේ ද කැන්ටන වල ද අනුමැතිය සඳහා ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ඉදිරිපත් කරයි. එහි දී ජනතාවගෙන් බහුතරයක් ද කැන්ටන බහුතරයක් ද එම කෙටුම්පතට එකඟවන්නේ නම් එම නව ව්‍යවස්ථා කෙටුම්පත සම්මත වේ.

3. **සංධීය ක්‍රමයක් වීම.**
**(N.B** සංධීය ආණ්ඩුක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න.)

ස්විට්සර්ලන්තය සංධීය රාජ්‍යයකි. ස්විට්සර්ලන්තයේ ප්‍රාන්ත හඳුන්වනු ලබන්නේ **කැන්ටන්** යනුවෙනි. ඒ අනුව ප්‍රාන්ථ හෙවත් කැන්ටන් **26** ක් ස්විස්ටර්ලන්තය තුළ පවතී. ඒ තුළ පූර්ණ කැන්ටන් 20 ක් ද අර්ධ කැන්ටන් 6 ක් ද ක්‍රියාත්මක වේ.

4. **සාමූහික විධායකයක් පැවතීම. (බහුත්ව විධායකය)**

ස්විට්සර්ලන්තයේ විධායකය සංධීය කවුන්සිලයයි. මෙය කැබිනට් ආණ්ඩුක්‍රමයක කැබිනට් මණ්ඩලයකට ද ජනාධිපති ආණ්ඩුක්‍රමයක ජනාධිපති වරයාට ද වඩා වෙනස් වූවකි. මෙය **සාමූහික විධායකයකි.** මෙම බහුත්ව විධායකය වන සංධීය සභාවේ සම්මතයෙන් සිව් (04) වසරක නිලකාලයක් සඳහා ව්‍යවස්ථාදායකය වන සංධීය මහා මණ්ඩලය විසින් තෝරාපත් කරයි. එහි සාමාජිකයින් 07 කි. එක් අයෙක් සභාපතිවරයා වේ.

5. **ලිබරල් න්‍යාය මත පදනම් වූ ආණ්ඩුක්‍රමයක් වීම.**

19 වැනි සියවස තුළ අධි ව්‍යාප්තියක් පැවති ලිබරල්වාදී දර්ශනය ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රම සම්පාදනයට දැඩි බලපෑමක් සිදු කළේ ය. ඒ බැව් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සෑම ස්ථානයකින්ම දක්නට ලැබේ. **පුද්ගලයා පල්ලියේ (ආගමික සංස්ථාවේ) හා අනෙකුත් පීතෘ මූලික ආයතන වල මර්ධනකාරී බලපෑමත් මුදවා ගැනීම - ඇයැදුම් , ඇදහීම් , කථන , පුවත්පත් හා රැස්වීම් නිදහස සැලසීම - නිදහස හා අනිවාර්ය අධ්‍යාපනය - නීතිය ඉදිරියේ සමානාත්මතාවය - වෙළෙඳ හා වානිජ කටයුතු පිළිබඳ නිදහස.**

6. **ප්‍රජාතාන්ත්‍රික ලක්ෂණ සුලභ වීම.**

ලිබරල්වාදී න්‍යාය මත පදනම වූ ස්විට්සර්ලන්තය සුපිරි ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ සුලභ රාජ්‍යයකි. නූතන රාජ්‍ය තුළ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය ශ්‍රේණිගත කිරීමේ කේන්ද්‍රය ස්විට්සර්ලන්තය ලෙස හඳුනාගත හැකිය.

**ජනතා ස්වාධිපත්‍යය - සමානාත්මතාවය - සර්වජන ඡන්ද බලය - ජනමත විචාරණය - ප්‍රාරම්භනය - රදළ හා කතිපායාධිපති වරප්‍රසාද අවලංගු කිරීම - ඇතැම් කැන්ටන වල සියලු වැඩිහිටි වැසියන්ගේ මූලික සභාවලින් ව්‍යවස්ථාදායක මණ්ඩල සමන්විත වේ. (ලැන්ඩ්ස් ජෙමින්) - විධායක නිලධාරීන් නිලවාදී ප්‍රවණතා විකාශන කරගෙන නොමැති වීම** - නමුත් 1971 තෙක් ස්ත්‍රීන්ට ඡන්ද බලය ලබා නොදුන් බවද දැක්වුව මනාය.

## 7. මූලික අයිතිවාසිකම්.

වෙනත් රාජ්‍යයන් හි මෙන් විධිමත් මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් හෝ ඒ හා සම්බන්ධ පනතක් ස්විට්සර්ලන්තය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සටහන් නොවේ. ස්විස් ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා නොකරන බවක් හෝ අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සටහන් කර නොමැති බවක් ඉන් ප්‍රකාශිත නොවේ. **ස්විට්සර්ලන්තය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පුරාම ජනතාවගේ මූලික අයිතිවාසිකම් විසිරී පවතී.** ඒ සුවිශේෂී ලක්ෂණයකි. ඒ අනුව , නීතිය ඉදිරියේ සමාන භාවය - යාම් ඊම් කිරීමේ අයිතිය - රටේ ඕනෑම පෙදෙසක පදිංචි වීමේ අයිතිය - ඡන්ද බලය - පුවත්පත් සමිති සමාගම් පෙත්සම් යැවීමේ අයිතිය - නිදහස් අධ්‍යයනය - ප්‍රාරම්නය - ආගම ඇදහීමේ අයිතිය - රටවැසි භාවය ලැබීමේ අයිතිය.

## 8. අධිකරණයට හිමි ද්විතික ස්ථානය.

ස්විට්සර්ලන්තය තුළ අධිකරණයේ බලය සීමා සහිත ය. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් බලතල හා ශක්තියෙන් අඩු අධිකරණයක් පවතියි. ස්විස් ශ්‍රේෂ්ඨාධිකරණය **වන ස්විට්සර්ලන්තය සංඝීය විනිශ්චය සභාවට හිමිවන්නේ සීමිත** අධිකරණ සමාලෝචන කාර්ය භාරයක් පමණි. එනම්, **සංඝීය මහා මණ්ඩලය සම්මත කරන පනත් කෙටුම්පත් වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීමට එම අධිකරණයට නොහැකිය. එම අධිකරණයට සිදු කළ හැක්කේ කැන්ටනීය ව්‍යවස්ථාදායක සභාවන් සම්මත කළ නීතියක් ව්‍යවස්ථානුකූල නොවන බව ප්‍රකාශ කිරීම පමණි.** ඒ අනුව අධිකරණ සමාලෝචන බලය අතින් ඉතා දුර්වල අධිකරණයක් ලෙස හඳුනාගත හැකිය. තවදුරටත් අධිකරණය දෙවනි වන බව තහවුරු කිරීම සඳහා සංඝීය මහා මණ්ඩලය විසින් අධිකරණයට සාමාජිකයින් තෝරාපත් කිරීම ද දැක්විය හැකිය. එපමණක් නොව ඇමරිකා එක්සත් ජනපදයේ හෝ ඉන්දියාවේ මෙන් සුවිශාල ජාතික අධිකරණ පද්ධතියක අග්‍රස්ථානය මෙයට හිමි නොවේ. තනිව ක්‍රියාත්මක වන එකම ජාතික අධිකරණ සංවිධානය ස්විට්සර්ලන්තය ජාතික විනිශ්චය සභාව වේ.

## 9. ත්‍රිවිධාරකාර පුරවැසි භාවය.

ස්විස්ටර්ලන්තයේ රටවැසි භාවය ත්‍රිවිධාකාරය. කිසිදු පුද්ගලයෙකුට කැන්ටන වැසියකු නොවී ස්විස්ටර්ලන්තයේ වැසියෙකු විය නොහැකිය. එමෙන්ම කිසිම පුද්ගලයෙකුට කොමියුන වැසියකු නොවී කැන්ටන පුරවැසි භාවය ලබා ගත නොහැකිය.

## 10. ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකය.

# ව්‍යවස්ථාදායකය

# ව්‍යවස්ථාදායකය - සන්ධීය සභාව
**(Federal Assembly) (සංධීය මහා මණ්ඩලය)**

පොදු හැඳින්වීම.

ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායක ආයතනය සංධීය මහා මණ්ඩලයයි. මෙය **සන්ධීය සභාව** ලෙස ද හඳුන්වයි. සංධීය මහා මණ්ඩලය ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායක ආයතනයකි.

I. ජාතික සභාව.
II. රාජ්‍ය සභාව.

හැඳින්වීම.

- **ජාතික සභාව (National Council)**

මොකක් ද?

ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායක සංධීය මහා මණ්ඩලයේ පළමු සභාව ජාතික සභාවයි. මෙය **ජාතික කවුන්සිලය** ලෙසද හඳුන්වයි. ව්‍යවස්ථාදායකයේ මහජන මන්ත්‍රී මණ්ඩලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වන්නේ මෙයයි.

සංයුතිය (පත්කිරීම / සාමාජිකයන්)

1963 සිට ක්‍රියාත්මක වන පරිදි ජාතික සභාවේ සාමාජික සංඛ්‍යාව 200 කි. එය ස්ථාවර සංඛාවකි. මූල් අවස්ථාවේ ජනගහනය 20,000 ට එක් නියෝජිතයෙක් තෝරාපත් කරගත් අතර පසුකාලීනව ජනගහනය 22,000 ට එක් අයකු දක්වා එය සංශෝධනය විය. සෑම වසර දහයකටම (10) වරක් ජන සංගණනයක් පැවැත්වේ. සමානුපාතික නියෝජන ක්‍රමයේ විවෘත්ත ලැයිස්තු ක්‍රමයට අනුව ජනතාව විසින් නියෝජිතයින් තෝරාපත් කරයි. ජාතික සභාව නියෝජිතයන් තෝරාගැනීමට පවත්වන මැතිවරණය ප්‍රාන්ථයක් (කැන්ටනයක්) එක් මැතිවරණ කොට්ඨාශයක් ලෙස සීමා නිර්ණය කරයි. **අවම වශයෙන් එක් කැන්ටනයකින් එක් සාමාජිකයෙකුවත් තෝරා ගත යුතු බවට කොන්දේසි පවතී.**

සුදුසුකම්

ජාතික සභාවේ මන්ත්‍රී ධූර අපේක්ෂකයින් සඳහා වූ සුදුසුකම් කිහිපයකි, මෙම මැතිවරණයට ඉදිරිපත් වීමට **පූජ්‍ය පක්ෂයට - විධායක නිලධාරීන් ට - ප්‍රධාන පරිපාලන සේවකයන්ට - රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරුන්ට - කැන්ටන මන්ත්‍රී වරුන්ට - රාජ්‍ය ද්‍රෝහීන්ට** නොහැකිය.

නිලකාලය

ජාතික සභාවේ නිලකාය වසර **හතරකි (04)**. **නමුත්** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්ණ සංශෝධන යෝජනාවක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයේ මණ්ඩල දෙක එකිනෙකට එකඟ නොවන විට නිලකාලයට පෙර විසිර යාමට සිදු වේ. ජාතික සභාවේ මන්ත්‍රීන් තෝරාගන්නා මැතිවරණය සාමාන්‍යයෙන් වසර හතරකට වරක් **ඔක්තෝම්බර් මාසයේ** අවසාන **ඉරු දින** පැවැත්වේ.

ජාතික සභාවේ සභාපති වරයෙක් හා උප සභාපති වරයෙක් වන්නේ ය. ඔවුන්ගේ නිලකාලය එක් (01) වසරකි. ඊළඟ වර්ෂයේ දී නැවත එම ධූරයන්ට ඔවුන් තෝරා පත් කර ගැනීමට නොහැකි ය. මුලසුන දරන සභාපතිවරයා සාමාන්‍යයෙන් ජාතික රාජ්‍ය සභාවේ දී ඡන්දය ප්‍රකාශ කරන්නේ නැත. නමුත් යම් මොහොතක යම් මතයක් සම්බන්ධයෙන් පවතින ඡන්ද සමාන වුවහොත් එවැනි මොහොතක ඔහු තීරක ඡන්දය ප්‍රකාශ කරයි. **ජාතික සභාවේ සන පූර්ණය මන්ත්‍රීන් 101 කි.** ජාතික සභාව තුළ නිල විපක්ෂයක් නොමැත. ආණ්ඩු පක්ෂයට හා විපක්ෂයට වෙන වෙනම අසුන් පනවා නැත. අසුන් ගන්නේ ඔවුන් පැමිණෙන පිළිවෙල අනුවය. ඝෝෂාකාරී ඔල්වරසන්, විරුද්ධ වීම්, තර්ජන. බැණවැදීම්, අපහාස උපහාස ස්විස්ටර්ලන්ත ජාතික සභාව තුළ නොමැත. ඡන්ද විමසීම් ඉතා දුබලය. ඊට හේතුව වන්නේ ගැටුම් වලින් තොරව සහජීවනයෙන් එකඟතාවයෙන් කටයුතු කරන නිසාවෙනි. උණුසුම් වාද විවාද සංවාද නොමැත. ජනමාධ්‍යය තුළින් ඒ සංවාද පිළිබඳ තොරතුරු වාර්තා කරන්නේ ඉතාම අවම මට්ටමකිනි. ඊට හේතු වන්නේ උණුසුම් තීව්‍ර මට්ටමේ ගැටුම් සහගත තත්වයන් එම සංවාද තුළ නොමැති වීමයි.

හැඳින්වීම

## ▪ රාජ්‍ය සභාව.

මොකක් ද?

ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායක සංධීය මහා මණ්ඩලයේ දෙවන සභාව රාජ්‍ය සභාවයි. **රාජ්‍යයන්ගේ කවුන්සිලය** ලෙස ද මෙය හඳුන්වයි. ස්විට්සර්ලන්තයේ ඉහළ මන්ත්‍රී මණ්ඩලය උත්තර මන්ත්‍රී මණ්ඩලය මෙය වේ. මෙම දෙවැනි සභාව **කැන්ටන වල භෞමික අඛණ්ඩතාවය , ස්වාධීනත්වය, සෛවයිරීත්වය තහවුරු කිරීමට ස්ථාපනය කළ අතර එමගින් කැන්ටන වල ස්වාධීනත්වය හා ගෞරවය ඔවුන් ක්‍රියාත්මක වේ.**

සංයුතිය (සාමාජිකයන් පත් කිරීම)

රාජ්‍ය සභාවේ සාමාජික සංඛ්‍යාව **46** කි. මෙම සභාවට සාමාජිකයින් තෝරාපත් කරගැනීමේ දී ප්‍රාන්ත (කැන්ටන) වලට සමාන නියෝජනයක් හිමි කර දී තිබේ. එය ඇමරිකාවේ සෙනෙට් මණ්ඩලයට නියෝජිතයින් තෝරා ගන්නා ක්‍රමයට සමාන ක්‍රමයකි. ඒ අනුව පූර්ණ කැන්ටනයකින් සාමාජිකයන් දෙදෙනා (02) බැගින් ද , අර්ධ කැන්ටනයකින් එක් (01) සාමාජිකයෙකු බැගින් ද තෝරා පත් කර ගනී. ස්විට්සර්ලන්තය තුළ පූර්ණ කැන්ටන 20 කි. අර්ධ කැන්ටන 06 කි. එම නිසා

| | | | |
|---|---|---|---|
| **පූර්ණ කැන්ටන** | **20 × 2** | = | **40** |
| **අර්ධ කැන්ටන** | **06 × 1** | = | **06** |
| | | | **46** |

ස්විස් රාජ්‍ය සභාවේ සාමාජිකයින් තෝරාපත් කර ගන්නා ආකාරය එකිනෙකට වෙනස් වේ. එක් එක් කැන්ටන විසින් සාමාජිකයින් තෝරාපත් කර ගැනීම සඳහා ඔවුන්ටම අදාළ වූ නෛතික තත්වයන් නිර්මාණය කර තිබේ. ඇතැම් ප්‍රාන්ත (කැන්ටන) වල ව්‍යවස්ථාදායක සභාවන් විසින් රාජ්‍යය සභාවේ සාමාජිකයන් තෝරාපත් කරයි. ඇතැම් ප්‍රාන්තවල ජනතාව විසින් එම නියෝජිතයින් තෝරාපත් කරයි.

| | |
|---|---|
| නිලකාලය | <u>රාජ්‍යය සභාවේ නිල කාලය ස්ථාවරව දක්වා නැත. එය වසර 1 සිට 4 දක්වා අතර කාලසීමාවක් තුළ ව්‍යාප්තව පවතී</u>. ඒ ඒ කැන්ටන වලින් රාජ්‍ය සභාව නියෝජනය කරනු ලබන සාමාජිකයින්ගේ ධූරකාලය ඒ ඒ ප්‍රාන්ත විසින් තීරණය කරයි. **පොදු වශයෙන් පවතින ධූරකාලය 03 න් වසරකි.** |
| වෙනත් | රාජ්‍ය සභාවේ ද සභාපතිවරයෙක් හා උප සභාපතිවරයෙක් සිටී. ඔවුන් ගේ එම තනතුරු එක් (01) වර්ෂයකට පමණක් සීමාවේ. සභාපතිවරයා හා උප සභාපති එක වර එකම කැන්ටනයක නියෝජිතයන්ට ලබා නොදෙයි. මෙම රාජ්‍ය සභාවේ සාමාජිකයන්ගේ වැටුප් ඒ ඒ කැන්ටනයේ ආදායම හා ආර්ථික තත්වයන් අනුව තීරණය වේ. මෙම මණ්ඩලයේ කටයුතු සිදු කරනු ලබන්නේ <u>මුළු මන්ත්‍රීන් සංඛ්‍යාවෙන් නිරපේක්ෂ බහුතරය මතය</u>. මෙහි නියෝජිතයින් ප්‍රාන්ථවල බලපෑමකින් තොරව ස්වකීය හෘදය සාක්ෂිය මත ක්‍රියාත්මක වෙමින් කටයුතු කිරීම ලක්ෂණයකි. |

- <u>කාර්යය හා බලතල.</u>

ස්විට්සර්ලන්තයේ ව්‍යවස්ථාදායකය සංඝීය මහා මණ්ඩලයයි. එය ද්වි මාණ්ඩලික ආකෘතියට ස්ථාපනය කොට තිබේ. පළමු සභාව ජාතික සභාව වන අතර දෙවන සභාව රාජ්‍ය සභාව වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයින් දෙවන සභාව බලවත් කොට නිර්මාණය කිරීමට උත්සුක වූහ. එහෙත් කාලයේ ඇවෑමෙන් ආණ්ඩුක්‍රම සම්පාදකයින්ගේ ආධ්‍යාශය බිඳ වැටුණි.

<u>ඊට බලපෑ හේතු,</u>

- **රාජ්‍ය සභාවේ සාමාජිකයින්ගේ ධූරකාල සීමාව ඒකාකාරී නොවීම.**
- **ආපසු කැඳවීමේ පිළිවෙත ක්‍රියාත්මක වීම.**
- **උන්නතිකාමී වැදගත් පුද්ගලයන් දෙවන සභාව වෙත ඇදී නොයාම.**

<u>මෙම තත්වයන් මත ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායක මණ්ඩල දෙකම සමාන (සාම්‍ය) බලතල බුක්තිවිඳින ආකාරය හඳුනාගත හැකිය. ලොව ඇති කිසිදු ව්‍යවස්ථාදායක සභාවක් තුළ මෙවැනි සමාන බලතල සහිත මණ්ඩල දෙකක් ක්‍රියාත්මක නොවේ</u>.

**<u>සී.එෆ්. ස්ට්‍රෝංග් මෙසේ ප්‍රකාශ කරයි.</u>**

**"ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායකය, එහි විධායකය මෙන් අසහාය තත්ත්වයක් උසුලයි. ලොව ඇති ව්‍යවස්ථාදායක අතරින් උත්තර දෙවන මන්ත්‍රී මණ්ඩලයේ බලතල මහජන මන්ත්‍රී මණ්ඩලයේ බලතල වලින් කිසිසේත්ම වෙනස් නොවන එකම ව්‍යවස්ථාදායකය එයයි."**

ස්විට්සර්ලන්ත ව්‍යස්ථාදායකය සංඝීය මණ්ඩලය වේ. ඒ තුළ පළමු හා දෙවන සභාවන්හි බලතල සමාන වේ. එම නිසා මණ්ඩලය දෙක සතු බලතල වෙන් වෙන්ව දැක්වීම අවශ්‍ය නැත. ව්‍යවස්ථාදායකය වන සංඝීය මහා මණ්ඩලයේ බලතල පොදුවේ මෙසේ දැක්විය හැකිය.

"නානාප්‍රකාර කටයුතු ඉටු කරන පාර්ලිමේන්තු දක්නට ලැබෙනුයේ කලාතුරකිනි. සැබවින්ම සංධීය මණ්ඩලය වෙත ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ හා ව්‍යවස්ථා, සංශෝධන යන ආදී වශයෙන් වූ නානාවිධ කාර්යයන් සමුදායක් පැවරී තිබේ."

-සර්වර්-

## 1. ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.

(i) **නීති සම්පාදනය කිරීම** (ව්‍යවස්ථාදානය). මුදල් හා සාමාන්‍යය නීති සංධීය මණ්ඩලයේ සභා දෙකටම ආරම්භ කිරීමට හැකිය.

(ii) **වාර්ෂික අයවැය ලේඛණය සම්මත කිරීම**, රාජ්‍ය ගිණුම් අත්පත් කර ගැනීම, සංධීය ආණ්ඩුව විසින් ආරම්භ කරනු ලබන රාජ්‍යය ණය අනුමත කිරීම.

(iii) **මුදල් පාලනය කිරීම**, ව්‍යවස්ථාදායකයේ මණ්ඩල දෙකටම මුදල් පාලනය සම්බන්ධයෙන් සමාන බලතල තිබේ.

(iv) රටේ බාහිර සුරක්ෂිතතාවයත්, ස්වාධීනත්වයත් නිශ්චය කරන විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

(v) කැන්ටනයන්හි භෞමික අඛණ්ඩතාවය හා කැන්ටන ව්‍යවස්ථාවන්හි අඛණ්ඩතාවන්, ස්විට්සර්ලන්තයේ අභ්‍යන්තර සුරක්ෂිතතාවයත් සාමයත් සහතික කරන ක්‍රියාමාර්ග යොදා ගනී.

## 2. විධායක අංශයේ කාර්ය හා බලතල.

(i) **මන්ත්‍රීමණ්ඩල දෙකම එකාබද්ධ සැසිවාරයක් වශයෙන් රැස්වී** (සංධීය කවුන්සිලය වන විධායකයේ සභිකයන් - සන්ධීය නිශ්ච සභාවේ විනිශ්චකරුවන් - චාන්සලර් වරයා - රක්‍ෂණ විනිශ්ච සභාවේ සාමාජිකයන් - හමුදාපති) තෝරාපත් කරගනී.

(ii) අනෙකුත් නිලධාරීන් පත් කර ගැනීමේ අයිතිය (බලය) විධායකය වන සංධීය කවුන්සිලයට පැවරීමේ හැකියාව.

(iii) සිවිල් සේවයේ කටයුතු අධීක්‍ෂණය කිරීම.

(iv) සංධීය නිලධාරීන් අතර ඇතිවන පරිපාලන ආරවුල් හා බලසීමා පිළිබඳ ගැටුම් නිරාකරණය කිරීම.

(v) සංධීය දෙපාර්තමේන්තු වලත්, චාන්සලර් හා එම කාර්යාලයේ නිලධාරීන්ගේ වැටුප් හා දීමනා තීරණය කිරීම.

(vi) ස්ථිර සංධීය නිලතල ඇති කිරීම හා ඒවායේ වැටුප් නිර්ණය කිරීම.

(vii) සංධීය හමුදාව පාලනය.

(viii) යුද්ධය ප්‍රකාශ කිරීම, සාම ගිවිසුම් ඇති කර ගැනීම.

(ix) සංධීය විනිශ්ච සභාවේ කටයුතු අධීක්ෂණය කිරීම.

(x) මිත්‍ර ගිවිසුම් හා සන්ධාන අනුමත කිරීම.

(විවිධ කැන්ටන එකිනෙක අතර හෝ, විදේශ රාජ්‍යයන් සමඟ හෝ ඇතිකර ගන්නා සන්ධාන හෝ මිත්‍ර ගිවිසුම් සංධීය මණ්ඩලය අනුමත කළ යුතු ය. එසේ අනුමත කළ යුතු වන්නේ විධායකය වන සංධීය කවුන්සිලය හෝ කැන්ටනයක් විසින් කළ අභියාචනාවක් පරිදි එකී කැන්ටන වල සන්ධාන, සන්ධීය මහා මණ්ඩලය වෙත යොමු කළේ නම් පමණි.)

## 3. අධිකරණ අංශයේ කාර්ය හා බලතල.

(i) සංධීය විනිශ්ච සභාවේ විනිශ්ච කරුවන් පත් කිරීම.

(ii) සන්ධීය බලධාරීන් අතර කාර්ය සීමා සම්බන්ධ ගැටුම් නිරාකරණය කිරීම.

(iii) සමාව හා පොදු සමාව දීමේ කාර්යන්හි පරමාධිපති බලය ක්‍රියාත්මක කිරීම.

## 4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

ව්‍යවස්ථාදායක සංධීය මහා මණ්ඩලයේ සභාවන් දෙකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධන කාර්යයට සම්බන්ධ වේ.

## සංධීය මහා මණ්ඩලයේ තත්වය.

සංධීය මහා මණ්ඩලය වෙත ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ - මූල්‍යමය - ව්‍යවස්ථාමය ආදී සියලු බලතල සංකේන්ද්‍ර ගත කොට තිබේ. නමුත් ඇතැම් බලතල නාම මාත්‍රික ස්වරූපයක් ගත් බලතල බව හඳුනාගත හැකිය. ඊට අදාළ හේතු,

**- විධායකය ඉවත් කිරීමට නොහැකි වීම.**
**- ව්‍යවස්ථා සංශෝධන කටයුතු සම්බන්ධ පූර්ණ බලතල හිමි නොවීම.**
**- නීති සම්පාදනය සඳහා ඇති එකම ආයතනය නොවීම.**

**කෝඩින් ප්‍රකාශ කළේ ,**

**"සංධීය මහා මණ්ඩලය තරමක් දුරට, ඡන්දදායකයින් තීරණ ගැනීමේ නියම බලය පාවිච්චි කරන්නා වූ හුදු උපදේශක මණ්ඩලයක තත්ත්වයට පත්ව තිබේ."**

කෙසේ නමුදු, ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායකය, සංධීය මහා මණ්ඩලය දරණ ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන බලතල කරණ කොට ගෙන එලඹිය හැකි නිගමනය වන්නේ බලතල පංගු කිරීමේ (බලතල බෙදීමේ න්‍යාය) ස්වට්සර්ලන්තයේ ක්‍රියාත්මක නොවන බවයි.

නමුත් ස්විස්ටර්ලන්ත ව්‍යවස්ථාදායකය පරමාධිපත්‍ය සහිත ව්‍යවස්ථාදායකයක් නොවේ.

- **සංධීය මහා මණ්ඩලය ගනු ලබන තීරණ වෙනස් කිරීමට ජනතාවට හැකි වීම.**
- **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පූර්ණ වශයෙන් සංශෝධනය කිරීමට මණ්ඩලය දෙක එකඟ නොවන විට එය විසිරී යා යුතු වීම.**
- **විධායකයට බලපෑම් කිරීමට හා එය ඉවත් කිරීමට බලය නොමැති වීම.**

නමුත්,

- **ස්විස්ටර්ලන්තයේ සංධීය විනිශ්චය සභාවට (අධිකරණයට) සංධීය මණ්ඩලය සම්පාදනය කරන පනත් වල ව්‍යවස්ථානුකූල භාවය පරීක්ෂා කිරීමට නොහැකිය.**

- **ජනාධිපතිවරයාට පනත් නිශේධ කිරීමේ බලය හිමි නොවේ.**

මෙම බලතල භුක්ති විඳුනු ලබන්නේ ස්විස්ටර්ලන්ත ජනතාවයි. විශේෂයෙන් ජනමත විචාරණය, ප්‍රාරම්භනය මගින් එම බලතල ජනතාව සතු කර තිබේ.

# විධායකය

## වි ධායකය (සංධීය කවුන්සිලය - Fedaral Council)

හැඳින්වීම.

මොකක් ද?

ස්විට්සර්ලන්ත විධායකය සංධීය කවුන්සිලය (Fedaral Council) වේ. මෙය **සාමුහික විධායකයකි.** කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක හෝ ජනාධිපති ආණ්ඩුක්‍රමයක හෝ මිශ්‍ර ආණ්ඩුක්‍රමයක මෙවැනි විධායකයක් දක්නට නොමැත. සැබවින්ම සාමූහික විධායකයක් ක්‍රියාත්මක වන එකම ජාතික රාජ්‍යය ස්විස්ටර්ලන්තය පමණි. එසේම ලිබරල් හෝ සමාජවාදී රාජ්‍යයන් තුළ මෙවැනි විධායකයන් දක්නට නොමැත.

> **"ලොව ඇති සියලු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතුරින් අනුපමේය වූ අසහාය ආයතනය ස්වීර විධායකය වේ."**
>
> **-සී.එෆ්. ස්ට්‍රෝංග්-**

සංයුතිය (සාමාජිකයින් පත් කිරීම)

මෙහි සාමාජිකයින් සංඛ්‍යාව **07** කි. තෝරාපත් කරගනු ලබන්නේ <u>ව්‍යවස්ථාදායකය</u> **සංධීය මණ්ඩලය** තුළිනි. සංධීය මණ්ඩලයේ ඒකාබද්ධ සැසිවාරයක දී එම සාමාජිකයින් **හත්දෙනා** තෝරාපත් කරයි. ඒ සඳහා නියත බහුතර ක්‍රමය භාවිතා කරයි. භූමිය, භාෂාව, ප්‍රාදේශීය විවිධත්වය සැලකිලිමත් වෙමින් මෙමපත් කිරීම් සිදු කරයි. මෙම සාමාජිකයින් විවිධ පක්ෂ වලට අයත් විය හැකිය. (එකම පක්ෂය අය නොවේ) නමුත් ඔවුන් පක්ෂ සම්බන්ධතා මත කටුයතු නොකරයි. සංධීය කවුන්සිලයට පත් වීමත් සමග ව්‍යවස්ථාදායකය වන සංධීය මහා මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඔවුන් ඉවත් වේ. <u>**බලතල අතින් සමානත්වයක් භුක්ති විඳින්නාවූත් එක සමාන අධිකාරී බලය දරන්නාවූත් සාමාජිකත්වයකින් මෙය සමන්විත වේ.**</u> ඔවුන් 07 දෙනා අතුරින් <u>**සභාපති වරයෙක් හා උපසභාපති වරයෙක්**</u> තෝරාපත් කර ගනී. ඔවුන්ගේ නිලකාලය එක් (01) වසරකි. ඉන්පසු ඔවුන් තම ධූර වලින් ඉවත් වේ. පසුව නව සභාපතිවරයෙක් හා උපසාභපති වරයෙක් තෝරාපත් කර ගනී. එහි දී උපසභාපති වරයා බොහෝ විට නව සභාපතිවරයා ලෙස තේරී පත් වේ. විධායකයේ <u>**සභාපතිවරයා**</u> **සමායන් අතර එක් අයෙක් පමණක් වේ. ඉන් ඔබ්බෙහි ඔහු විධායකයේ කේන්ද්‍රය හෝ ශීර්ෂය හෝ ප්‍රධානියා නොවේ.**

නිලකාලය

විධායකය වන සංධීය කවුන්සිලයේ නිලකාලය වසර **04** කි. නමුත් ඔවුන් ඊට වඩා දීර්ග නිලකාලයක් භුක්ති විඳී. සාමාන්‍යය තත්ත්වය තුළ **වසර 10** ක පමණ ධූකාලයක් හොබවයි. ඇතැම් සංධීය විධායක සභිකයන් ඊට වඩා දීර්ග නිලකාල භුක්ති විඳින අවස්ථා පවතී, ගෘවස්ප් මෝතා 29 - නයිෆ් 27 - වෙල්ට් 25 - ෆිලිප් 23

### ■ <u>සංධීය කවුන්සිලයේ කාර්ය හා බලතල (භූමිකාව)</u>

විධායකය සංධීය කවුන්සිලය සතුව ව්‍යවස්ථාදායක - විධායක - අධිකරණ - මූල්‍යය යන අංශයන්හි බලතල හිමි වේ.

ව්‍යවස්ථාදායක අංශයේ කාර්ය හා බලතල.

(i) පනත් කෙටුම්පත් වලට මුල පිරීම.

විධායක සංධීය කවුන්සිලයේ සාමාජිකයින් ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් නොවුන ද ඔවුන්ට පනත් කෙටුම්පත් ආරම්භ කළ හැකිය. එය සංධීය මහා මණ්ඩලයේ ඉල්ලීම මත හෝ තමන්ට යෝග්‍ය යැයි හැඟෙන අන්දමින් සිදු කළ හැකිය.

(ii) ව්‍යවස්ථාදායකයේ වාද විවාද සංවාද වලට සහභාගී විය හැකි වීම.

විධායක සංධීය කවුනිසිලයේ සාමාජිකයන්ට ව්‍යවස්ථාදායක සංධීය මණ්ඩලයට පැමිණිය හැකිය. වාද විවාද සංවාද වලට සම්බන්ධ විය හැකිය. අදහස්පල කළ හැකිය. නමුත් ඒතුළ ඡන්දය පාවිච්චි කිරීමට නොහැකිය.

(iii) ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් වලට බලපෑම් කිරීමට හැකිවීම.

ව්‍යවස්ථාදායකය වෙත ඉදිරිපත් කෙරෙන පනත් කෙටුම්පත් පරීක්ෂා කරනු ලබන්නේ කමිටු රැස්වීම් පවත්වමිනි. එම කමිටු රැස්වීම් වලට සහභාගීවෙමින් ස්වකීය බුද්ධිය හා දක්ෂතාවය භාවිතා කරමින් පනත් කෙටුම්පත් වලට බලපෑම් කළ හැකිය.

(iv) පෞද්ගලික මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරන පනත් සම්බන්ධයෙන් ස්වකීය අදහස් පළ කිරීම.

(v) රටේ තත්ත්වය ව්‍යවස්ථාදායකයට දැනුම් දීම.

විධායක අංශයේ කාර්ය හා බලතල.

(i) නීති ක්‍රියාත්මක කිරීම.
සංධීය මහා මණ්ඩලය විසින් සකස් කරන ලද නීති හා අධිකරණය දෙන ලද තීන්දු ක්‍රියාවට නැංවීම විධායක සංධීය කවුන්සිලය විසින් සිදු කරයි.

(ii) රටේ නීතිය හා සාමය පවත්වා ගෙන යාම.

(iii) සංධීය කටයුතු පරිපාලනය කිරීම.

(iv) රාජ්‍ය නිලධාරීන් පත් කිරීම.
ව්‍යවස්ථාදායක සංධීය මහා මණ්ඩලය විසින් ඒකාබද්ධ සැසිවාරයක දී පත් කළ යුතු නිලධාරීන් හැර අනිකුත් නිළධාරීන් පත් කිරීම.

(v) කැන්ටනවල ව්‍යවස්ථා පිළිපැදීම සහතික කිරීම.

(vi) කැන්ටන ආණ්ඩු වල කටයුතු අධීක්ෂණය කිරීම.

(vii) කැන්ටන අතර හා කැන්ටන හා විදේශ රාජ්‍යයන් අතර ඇති කරගන්නා සන්ධාන මිත්‍ර සමාගම් අනුමත කිරීම.

(viii) රාජ්‍යයේ බාහිර සම්බන්ධතා ආරක්ෂා කිරීම.

(ix) සන්නද්ධ හමුදා කැඳවිය හැකි වීම.
මෙසේ සන්නද්ධ හමුදා කැඳවීමට හැකි වන්නේ හදිසි තත්වයන් තුළ දී පමණි. එසේ කැඳවීමට හැකි වන්නේ සංඝීය මහා මණ්ඩලය යැයි නොපවත්වන (විසිරි) ඇති අවස්ථාවක පමණි.

(x) කැන්ටන අතර ඇති වන ගැටුම් නිරාකරණය කිරීම.

<u>අධිකරණ අංශයේ කාර්ය හා බලතල.</u>

(i) යම් යම් පරිපාලන පැමිණිලි විභාග කිරීම.

ස්විස්ටර්ලන්තය තුළ පරිපාලන අධිකරණ නොමැත. එම නිසා පරිපාලන නිලධාරීන් සම්බන්ධ පැමිණිලි විභාග කිරීම සංඝීය කවුන්සිලය විසින් සිදු කරයි.

**නිදර්ශන -:**

මූලික පාසල් වල සිසුන්ට වෙනස්කම් කිරීම, වෙළෙඳාමට අදාළ සන්ධාන, යුද හමුදා අය බදු ක්‍රම, සිරිත් විරිත්, කැන්ටන ඡන්ද විමසීම් යන මේවා කෙරෙන් පැන නගින වෙනස්ම් යනාදී විෂයන් පිළිබඳව කැන්ටනීය ආණ්ඩු ගන්නා තීන්දු කෙරෙහි අභියාචනා අධිකාරී බලය සංඝීය කවුන්සිලය සතු ය.

<u>මූල්‍යමය අංශයේ කාර්ය හා බලතල.</u>

(i) මූල්‍ය කටයුතු පරිපාලනය කිරීම.

(ii) වාර්ෂික අයවැය ලේඛණය සකස් කිරීම.

(iii) ව්‍යවස්ථාදායකය විසින් කරනු ලබන වියදම් අධීක්ෂණය කිරීම.

(iv) දුම්රිය සේවා වැනි ජාතික ව්‍යාපාර කළමණාකරණය කිරීම.

**තවදුරටත්,**

<u>හදිසි අවස්ථා බලතල.</u>

විධායක සංඝීය කවුන්සිලයේ හදිසි අවස්ථා සම්බන්ධ බලතල ද පවතී. 1914 පළමු 1939 දෙවන ලෝක මහා සංග්‍රාම පැවති කාලය තුළ ව්‍යවස්ථාදායක සංඝීය මහා මණ්ඩලය විසින් පවරන ලද බලතල හේතු කොට ගෙන එය එකම ව්‍යවස්ථාදායකය බවට පත්වී ජනවිචාරණය කෙරෙහි ද තහංචි පැනවීය.

## ● <u>ස්විට්සර්ලන්ත විධායක කවුන්සිලයේ සුවිශේෂී ලක්ෂණ.</u>

1. **බහුත්ව විධායකය.**

පරම විධායක බලය තනි පද්ගලයකු වෙත පැවරෙන එක්සත් රාජධානිය , ඇමරිකා එක්සත් ජනපදය හා ප්‍රංශය මෙන් නොව ස්විස්ටර්ලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංයුක්ත රාජ්‍යයේ උත්තරීතර විධායක බලය බහුත්ව මණ්ඩලයක් වන සංධීය කවුන්සියලයට පැවරයි. එය බලතල අතින් සමානත්වයක් භුක්තිවිඳින්නාවූත් සමාන අධිකාරී බලයක් දරන්නා වූත් සාමජිකයන් 07 දෙනෙකුගෙන් සමන්විත වේ.

2. **දීර්ඝ නිල කාලය.**

විධායක සාමාජිකයින්ගේ දීර්ඝ නිලකාලය ද සංධීය කවුන්සිලයේ වැදගත් ලක්ෂණයකි. සිව් (04) වසරක නිලකාලයක් සඳහා ව්‍යවස්ථාදායක සංධීය මහා මණ්ඩලය විසින් තෝරාපත් කළ ද විශේෂිත හේතු නිසා ඔවුන්ගේ ධූර කාලය දීර්ඝ වී තිබේ.

හේතු -:

- සිටිනා පරිපාලකයෙකු ධූරයෙන් ඉවත් කිරීම අවිචාරවත් ක්‍රියාවක් ලෙස විශ්වාස කිරීම.
- විධායක සභිකයන් තෝරා ගැනීමට සිදුව ඇත්තේ සීමිත සාමාජිකයින් සංඛ්‍යාවක් අතුරෙන් වීම.
- එක් කැන්ටනයකින් තෝරා ගත යුත්තේ එක් සභිකයෙක් පමණක් වීම.
- ඔවුන් කිසියම් පක්ෂයකට අයත් නොවීම.
- සභිකයන්ට අධික වැටුප් හා පරප්‍රසාද නොවීම.

**"තමා දුම්රියේ තුන්වැනි පංතියේ ගමන් කළේ මන්දැයි විධායක සභිකයෙකුගෙන් විමසුවිට සිව් වැනි පංතියක් නොමැති නිසා යැයි"** ඔහු පවසා තිබේ."

සමාජයේ ප්‍රකට පුද්ගලයන් සාටෝපී ලෙස හැසිරෙනු දැකීමට ස්විස් ජනතාව අකමැතිය. ඔවුන් රාජ්‍යය තන්ත්‍රඥ ගරු ගාම්භීරක්වයෙන් හා බොරු ආටෝපයෙන් තොර නිර්ව්‍යාජ සාමාන්‍යය ජීවිත ගත කරයි. ඉහත තත්ත්වයන් නිසා ස්විට්සර්ලන්ත විධායක සභිකයෙකුගේ සාමාන්‍යය ධූරකාලය වසර 10 ඉක්මවයි. නමුත් ගෘවස්ප් මෝනා අවු 29 ක් ද නයිෆ් අවු. 27 ක් ද - වෙල්ට් අවු 25 ක් ද ෆිලිප් - අවු 23 ද ආදී වශයෙන් ධූර දැරූ අවස්ථා ද පවතී.

3. **සභිකයන් පක්ෂ භජනයෙන් තොර වීම.**

ස්විස් විධායකයෙහි කැපී පෙනෙන තවත් ලක්ෂණයක් වන්නේ සභිකයන් පක්ෂ භජනයෙන් තොර වීමයි. සභිකයන් විවිධ දේශපාලන පක්ෂ වලට අයත් වුවද ඔවුහු පක්ෂ පදනමෙහි පිහිටා කටයුතු නොකරයි. පක්ෂ ආණ්ඩුක්‍රමයක,

යම් තනි පක්ෂයක් ව්‍යවස්ථාදායකයේ බහුතර බලය දරන්නේ නම් මුළු විධායකයම තෝරාගනු ලබන්නේ එම පක්ෂයේ සාමාජිකයන් අතුරෙනි. දේශපාලන සමජාතීයත්වය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක මූලිකම ලක්ෂණයකි. එම නිසා විධායකය තනි පක්ෂයකින් තෝරා ගනී. **නමුත්** ස්විස්ටර්ලන්තයේ විධායක සංධීය කවුන්සිලයට සභිකයින් තෝරා ගනු ලබන්නේ පක්ෂ පදනමක් මත නොවේ. **පරිපාලකයන් වශයෙන් ඔවුන් දක්වා ඇති දක්ෂතාවය** මත එම තෝරාගනීම සිදු කරයි. ඒ අනුව ස්විස් විධායකය, **පරිපාලකයින් වශයෙන් තමන් දක්වා ඇති දක්ෂතාවයන් නිසා තෝරාගනු ලැබූ හා ජාතික දේශපාලඥයන් ඇති කණ්ඩායමකින් සමන්විත වේ.**

**"යම් පුද්ගලයෙකු විධායක සංධීය කවුන්සිලයට සුදුසු සාමාජිකයෙකු වන්නේ එම පුද්ගලයාගේ පරිපාලන දක්ෂතා, අවබෝධ ශක්තිය, සිහි බුද්ධිය , උපාය කෞෂල්‍යය හා මනෝභාවයන් යනාදී ලක්ෂණ අනුවය."**

-ලැස්කි-

නිපුනතාවන්ගෙන් හෙබි කරීකයන් හෝ කුටිල උපක්‍රමකාරීන් ස්විස් ජනතාව නොසොයති. මෙම විධායක සභිකයින් කුමන හෝ පක්ෂයක ප්‍රබල සාමාජිකයන්ගේ තත්වයෙන් මිදී තිබේ. එසේම ඔවුන් මහජන යහපත පෙරදැරි කොටගෙන සමථකාරී හා අන්‍යොන්‍යය සහයෝගය පිළිබඳ හැඟීමෙන් යුතුව පරිපාලන කණ්ඩායමක් ලෙස කටයුතු කරති. <u>බ්‍රයිස් සාමි</u> ප්‍රකාශ කළේ **නිදහස් රටක ක්‍රියාකාරී විධායකය පක්ෂ දේශපාලනය හා මෙතරම් අඩු සම්බන්ධ කමක් දක්වන තත්වයක් දක්නට නො ලැබේ** යනුවෙනි.

4. **සභාවේ සභාපතිවරයා දරණ තත්ත්වය.**

ව්‍යවස්ථාදායක සංධීය මහා මණ්ඩලය විසින් එක් (01) වසරක කාලයක් සඳහා සංධීය සභිකයන් අතුරෙන් කෙනෙක් සභාපතිවරයා ලෙස තෝරාපත් කරයි. සභාවේ සභාපතිත්වය වර්ෂයෙන් වර්ෂය සංධීය කවුන්සලයේ සංධිය සභිකයන් අතර මාරුවේ. **සංධීය කවුසිලයේ මුලසුන දරන සභාපති ස්විට්සර්ලන්ත <u>ජනාධිපතිවරයා</u> ලෙස හඳුන්වයි.** මෙය වූ කලී හුදු ආචාරශීලීභාවයම තකා පිරිනැමෙන ගරු නාමයකි. වසරකට පසුව ඔහු සෙස්සන් අතරම කෙනෙක් බවට පත්වන නිසා **ඔහු සමයන් අතර ප්‍රමුඛ තැන පවා නොදරයි.** ජනාපතිවරයා විශේෂ බලතල කිසිවක් භුක්ති නොවිඳී. සංධීය කවුනිසිලය විධායකයක් ලෙස රැස්වන විට එහි මුලසුන දරයි. ඒ තුළ යම් කරුණක් සම්බන්ධයෙන් ඡන්ද සම සමව ප්‍රකාශ වුවහොත් තීරක ඡන්දය ඔහුට භාවිත කළ හැකිය. සංධීය කවුන්සිලයට පොදුවේ ක්‍රියාවට නැංවිය නොහැකි චාරිත්‍රානුකූල කාර්යයන් කිහිපයක් සභාපතිවරයා ක්‍රියාවට නගයි.

නිදසුන් -: රාජ්‍ය උත්සව අවස්ථාවන්හි මුලසුන දැරීම.

විදේශ රාජ්‍යය ධූතයන් තානාපතිවරු පාලකයන් පිළිගැනීම.

ස්වදේශය තුළත් විදේශය තුළත් ස්වකීය රට නියෝජනය කිරීම.

දෙපාර්තමේන්තුවක ප්‍රධානියා ලෙස කටයුතු කිරීම.

විධායක සභාපතිවරයාට ලබාදී ඇත්තේ ඉතාම සීමිත කාර්ය හා බලතල ප්‍රමාණයක් පමණි. ආචාර්ය මුන්රෝ විසින් ස්විට්සර්ලන්ත සංධීය කවුන්සිලයේ සභාපතිවරයාගේ තත්වය මෙසේ ප්‍රකාශ කරයි. "**සභාපති හුදෙක් සංධීය රාජ්‍යයේ නාම මාත්‍රික නායකයා වන අතර උත්සව අවස්ථාවලදී එය නියෝජනය කරයි. එහෙත් සම්ප්‍රදාය අනුව ඔහු විවිධ පරිපාලන දෙපාර්තමේන්තු වල කටයුතු ඉටු කිරීමේ වගකීම පැවරී ඇති එක්තරා අන්දමක පොදු අධීක්ෂකයකුගේ තත්වයට පත්ව සිටී.**

විලියම් රැපාඩ් විසින් සභාපතිවරයාගේ තත්වය නිවැරදිව මෙසේ ප්‍රකාශ කරයි. "**කෙටියෙන් පවසතොත් ඔහු දරන නිලය කිසිදු ජාතික වැදගත් කමකින් යුක්ත නොවේ. එයට කිසිදු විශේෂ වරප්‍රසාද නැත. එමෙන්ම කිසිදු සුවිශේෂී බලපෑමක් ද කළ නොහැකි ය. ඔහුට නිල රථයක් නොලැබේ. එමෙන්ම ඔහුට පදිංචිය සඳහා සුවිසල් රජ මැදුරක් වැනි වූ මන්දිරයක් නොලැබේ. මෙපරිදිව වෙනත් පාර්ලිමේන්තු හෝ ජනාධිපති ආණ්ඩුක්‍රමයන්හි දක්නට ලැබෙන සම්භාවනීය නිලතල හා සම්බන්ධිත ආටෝපය හා අලංකාරය ස්විස්ටර්ලන්ත ජනාධිපතිවරයාට හිමි වී නැත.**

5. **පාර්ලිමේන්තු හෝ ජනාධිපති ආණ්ඩුක්‍රමයක් නොවීම.**

ස්විට්සර්ලන්ත විධායකය ස්වරූපය අතින් පාර්ලිමේන්තු ක්‍රමයක් වත් ජනාධිපති ක්‍රමයක් වත් නොවේ. එය එම ක්‍රම දෙකෙන්ම මූලික වශයෙන් වෙනස් වේ. මෙම ආණ්ඩුක්‍රම දෙකෙහිම දුර්වලතා මඟහැර එම ක්‍රම දෙකෙහි ඇති හිතකර ලක්ෂණ පමණක් සංයෝග කොට ස්විට්සර්ලන්ත විධායකය ගොඩනගා තිබේ.

6. **පාර්ලිමේන්තු විධායකයක් නොවීම. (කැබිනට් ක්‍රමයක් නොවීම)**

- ස්විස්ටර්ලන්ත සංධීය කවුන්සිලය ව්‍යවස්ථාදායකයට වග නොකියයි.
- ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් විධායක සංධීය සභිකයන් වශයෙන් තෝරාපත් කර ගැනීමත් සමග ව්‍යවස්ථාදායකයේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය යුතු වීම.
- ව්‍යවස්ථාදායකයේ වාද විවාද සංවාද වලට විධායක සභිකයන් සහභාගී වුවද එහිද ඡන්ද ප්‍රකාශ කිරීම කළ නොහැකි වීම.
- විශ්වාස භංග යෝජනාවක් මගින් විධායක සභිකයන් ඉවත් කිරීමට ව්‍යවස්ථාදායක සංධීය මහා මණ්ඩලයට නොහැකි වීම.
- අගමැති ධූරයක් නොමැති වීම.
- විධායකයන් දෙකක් නොමැති වීම.
- සාමූහික වගකීමක් නොමැති වීම.
- විධායක සභිකයින් විවිධ දේශපාලන පක්ෂවලින් තෝරා ගැනීම.
- විධායක සාමාජිකයන් තෝරාගනු ලබන්නේ පක්ෂ නායකත්වය හෝ ජ්‍යෙෂ්ඨත්වය මත නොව පරිපාලන දක්ෂතාවය, උපායශීලීභාවය වැනි කරුණු මත වීම.

7. **ජනාධිපතික්‍රමය කේන්ද්‍ර කරගත් විධායකයක් නොවීම.**

- ජනාධිපති ක්‍රමයකට සමාන ලක්‍ෂණ.

**නිදර්ශන ලෙස ඇමරිකානු ජනාධිපති විධායක ක්‍රමයේ ලක්‍ෂණ හා ස්විට්සර්ලන්ත විධායකය සංධීය කවුන්සිලය අතර පවතින සමාන ලක්‍ෂණ කිහිපයකි.**

(i) විධායකයන්හි ස්ථිරභාවය.
(ඇමරිකාවේ) ජනාධිපති මෙන්ම ස්විස්ටර්ලන්තයේ සංධීය කවුන්සිලය ස්ථාවර හැඩයක් ගනී.)

(ii) ව්‍යවස්ථාදායකයට පහසු ක්‍රියාවලියකින් විධායකය විසුරුවා හැරීමට නොහැකි වීම.

(iii) ව්‍යවස්ථාදායකය විසුරුවා හැරීමට විධායකයට නොහැකි වීම.
(ඇමරිකානු ජනාධිපතිට ව්‍යවස්ථාදායකය කොංග්‍රස් මණ්ඩලය විසුරුවා හැරීමට නොහැකිය. එසේම ස්විස්ටර්ලන්තයේ විධායකය සංධීය කවුන්සිලයට ව්‍යවස්ථා දායක සංධීය  මහා මණ්ඩලය විසුරුවා හැරීමට නොහැකිය.)

(iv) විධායකයේ සාමාජිකයන් ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් නොවීම.
(ඇමරිකානු ජනාධිපති හා කැබිනට් ලේකම් මණ්ඩලය කොංග්‍රස් සාමාජිකයන් නොවේ. ස්විසර්ලන්තයේ විධායක සංධීය සභිකයන් එයට තේරීපත් වූ පසුසංධීය මහා මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඉවත් විය යුතු ය.)

- ජනාධිපති ක්‍රමයෙන් වෙනස් වන ලක්‍ෂණ.

(i) ඇමරිකාව තුළ මෙන්ම බලතල බෙදීමේ සිද්ධාන්තය ස්විට්සර්ලන්තය තුළ ක්‍රියාත්මක නොවීම.

(ii) ඇමරිකාව තුළ මෙන්ම සංවරණ තුළන සිද්ධාන්තය ස්විට්සර්ලන්තය තුළ ක්‍රියාත්මක නොවීම.

(iii) ඇමරිකානු ජනාධිපතිට සමාන බලතල සංධීය විධායකයේ සභාපතිවරයාට හිමි නොවේ.

(iv) ස්විට්සර්ලන්තයේ විධායක සභිකයන්ට ව්‍යවස්ථාදයකයේ රැස්වීම්වලට සහභාගීවිය හැකිය. නමුත් ඇමරිකාවේ විධායක සාමාජිකයන්ට කොංග්‍රස් මණ්ඩයේ රැස්වීම් වලට සහභාගී විය නොහැකිය.

(v) ඇමරිකාව තුළ විධායකයේ ප්‍රධානියා ජනාධිපතිවරයා ය. විධයකය තුළ සිදු වන්නේ ඔහුට අවශ්‍යදේය. නමුත් ස්විට්සර්ලන්තය තුළ විධායක ජනාධිපතිවරයා සමානයන් අතර සමාන අයෙක් පමණි.

**(N.B තවදුරටත් ඇමරිකානු ජනාධිපතිවරයා සහ ස්විස්ටර්ලන්ත විධායක සංධීය කවුන්සිලයේ තත්ත්වය සසඳමින් වෙනස්කම් සොයන්න.)**

8. **විධායකය සංධීය කවුන්සිලය සතු බලතල වැඩි වී තිබීම.**

සංධීය කවුන්සිලයේ බලතල ක්‍රමයෙන් වර්ධනය වී ඇති බව ස්විට්ස්ර්ලන්ත දේශපාලන ඉතිහාසය හැදෑරීමෙන් මනාව ගම්‍යය මාන වේ. ඊට බලපෑ හේතු කිහිපයකි. **සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීමත් සමග සංධීය මහා මණ්ඩලයට තේරී පත් වී ඇති බහුවිධ කණ්ඩායම් අතර වාද විවාද කේවල් කිරීම් ආදිය නිසා එය පොර පිටියක් බවට පත්වීම. එම නිසා සංධීය මහා මණ්ඩලයේ කීර්තිය පිරිහෙමින් පවතී. අනිත් අතට විධායක සංධීය කවුන්සිලයේ කීර්තිය වැඩි වෙමින් පවතී. - ලෝක මහා සංග්‍රාම 1930 ගණන්වල ඇතිවූ ආර්ථික අවපාතය** <u>ලෝක මහා සංග්‍රාම හා ආර්ථික අවපාතය පවතින අවධියෙහි ස්විස්ටර්ලන්තයේ අපක්ෂපාතීත්වය රැකගනු වස් ව්‍යවස්ථාදායක සංධීය මහා මණ්ඩලය විසින් විධායක සංධීය කවුන්සිලයට **සර්වග්‍රාහී බලතල** පවරා දුන්නේ ය.</u> මෙසේ පවරා දී ඇති බලතල පසුව ආපසු නොගන්නා ලදි. එම නිසා සංධීය විධායක කවුන්සිලය බලවත් වී තිබේ. <u>**ආන්ද්‍රායි**</u> ගේ මතය අනුව ඉහත සඳහන් කරන ලද හේතු **නිසා විධායක සංධීය කවුන්සිලය අනුක්‍රමයෙන් අර්ධ පරමාධිකාරී බලයක් දරණ තත්වයට පත්ව තිබේ.** වෙනත් ආකාරයකින් දක්වන්න් නම් **එය තවදුරටත් සහාය මණ්ඩලයක් වශයෙන් නොපවතී.**

සංධීය කවුන්සිලයේ සභික පිරිස 7 ක් වුවද සෑම බදාදා දිනකම ස්විට්සර්ලන්තයේ **බර්න් නුවර** පෙඩරල් පැලස් හිදී මෙය රැස්වන විට එයට 8 වන සාමාජිකයෙකු එකතු වේ. ඒ ස්විට්සර්ලන්ත **චාන්සලර්** වරයා ය. ඔහු එරට ඒකාබද්ධ මාණ්ඩලික ප්‍රධානියාය. ඔහු පරිපාල ක්ෂේත්‍රයේ ඉහළම නිලධාරියා වන්නේ ය. නියෝජ්‍ය චාන්සලර්වරයෙක් ද සිටියි.

# අධිකරණය

## අධිකරණය (සංධීය විනිශ්චය සභාව)

හැඳින්වීම.

මොකක් ද?

ස්විට්සර්ලන්තයේ ඇති එකම ජාතික අධිකරණය වන්නේ සංධීය විනිශ්චය සභාවයි. 1874 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙය පිහිටුවීය. නමුත් ඊට පෙර පවා යුක්තිය පසඳලීම පිණිස අධිකරණ ආයතනයන් පැවතුනි. නමුත් එම අධිකරණයට කැන්ටන අතර හෝ මධ්‍ය ආණ්ඩුව හා කැන්ටන අතර ඇතිවන ගැටුම් නිරාකරණය කිරීමේ බලය පවරා දී තිබුණේ නැත. 1874 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අධිකරණ බලතල කිසියම් ප්‍රමාණයකින් වර්ධනය කළේ ය. පසුව ඇති කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින් එහි බලතල තවදුරටත් වර්ධනය කළේ ය. මෙම සංධීය විනිශ්ච සභාව ප්‍රථම වරට රැස්වූයේ 1885 වර්ෂයේ දී ය.

සංයුතිය (සාමාජිකයින් පත් කිරීම)

සංධීය විනිශ්ච සභාවේ විනිශ්ච කරුවන් 38 කි. ඒ තුළ විනිශ්චකාරවරු 28 සහ විකල්ප (නියෝජ්‍යය) විනිශ්චකාරවරු 12 ක් කටයුතු කරයි. මෙම විනිශ්චකාරවරු පත් කරනු ලබන්නේ ව්‍යවස්ථාදායකය සංධීය මහා මණ්ඩල ඒකාබද්ධ සැසිවාරයකදී ය. ඒ තුළ කටයුතු කිරීමට දෑ (02) අවුරුදු නිල කාලක් සඳහා සභාපති වරයෙකු හා උප සභාපතිවරයෙකු තෝරා ගනී. වසර දෙක ගෙවී ගිය පසු ඔවුන් එම තනතුරුවලින් ඉවත් වේ. නව සභාපති හා උප සභාපතිවරයෙක් තෝරාගනී. ප්‍රයෝගික තත්ත්වය තුළ උප සභාපතිවරයා නව සභාපති ධූරය සඳහා තේරීපත් වෙයි.

නිලකාලය

සංධීය විනිශ්ච සභාවේ විනිශ්චකාර වරුන්ගේ නිලකාය වසර 06 කි.

- <u>කාර්ය හා බලතල</u>

සංධීය විනිශ්ච සභාවේ කාර්ය හා බලතල අංශ 03 ක් යටතේ සාකච්ඡා කළ හැකිය. සිවිල් නීතිය සම්බන්ධ කාර්යන් - රාජ්‍යය (මහජන) නීතිය සම්බන්ධ කාර්යන් - රාජ්‍යය ද්‍රෝහීන් සම්බන්ධ අපරාද නඩු සම්බන්ධ කාර්යයන්.

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය.

   ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලය සංධීය විනිශ්ච සභාව සතු නොවේ. නමුත් ප්‍රාන්ත ව්‍යවස්ථා අර්ථ නිරූපණය කිරීමේ හැකියාව සංධීය විනිශ්ච සභාව සතු වේ. ඒ අනුව සංධීය විනිශ්ච සභාවට අධිකරණ ප්‍රති නිරීක්ෂණ බලය නොමැත.

2. මූලික අධිකරණ බලතල.

   එනම් මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු අතර , කැන්ටන - කැන්ටන අතර ඇතිවන ගැටුම් විසඳීම සංධීය විනිශ්ච සභාව සතු කාර්ය හා බලතලයකි.

3. අභියාචනාධිකරණ බලතල.

4. මූලික අයිතිවාසිකම්.
සංඝීය විනිශ්ච සභාව ජනතාවගේ මූලික අයිතිවාසිකම් තහවුරු කරයි. එයින්,

5. ව්‍යාජ ක්‍රියා ඡන්ද දූෂණ පිළිබඳ නඩු විභාග කිරීම.

6. රාජ්‍ය ද්‍රෝහීත්වය, කැරලි හෝ සාහසිකම් පිළිබඳ නඩු

7. පරිපාලනමය නඩු විභාග කිරීම.
මෙම නඩු කලින් විභාග කරන ලද්දේ සංඝීය කවුන්සිලය වන විධායකය විසිනි. 1925 න් පසුව එම බලතල සන්ධීය විනිශ්ච සභාව විසින් ක්‍රියාත්මක කරයි.

8. ඡන්ද පෙත්සම් විභාග කිරීම සහ එරට මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කිරීම.

9. උපදේශන අධිකරණ බලය.
පාලක පාලිත දෙපාර්ෂවයටම නීති උපදේශන සේවාවන් ලබා දීම.

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයා වීම.

නමුත් සංඝීය විනිශ්චය සභාවට අධිකරණ ප්‍රති නිරීක්ෂණ බලය නොමැත.

මෙම තත්වයන් අනුව බලන කළ ස්විස් සංඝීය විනිශ්චය සභාව බලවත් අධිකරණ ආයතනයක් නොවේ. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් , එය ශ්‍රේෂ්ඨ, උත්තරීතර , අධිකරණයක් නොවේ.

# සන්ධීය ක්‍රමය

## සංඝීය ක්‍රමය

ස්විට්සර්ලන්තය සංඝීය ක්‍රමයකි. මුල් අවස්ථාවේ එය සහසංඝීය ක්‍රමයක් ලෙස අර්ථ නිරූපණය කළේ ය. සහ සංඝීය ක්‍රමයක් යනු ස්වාධීන රාජ්‍යයන් සමූහයකින් ගොඩනැගුණු සාමූහික රාජ්‍යය එකතුවකි. නමුත් වර්තමානය තුළ එය සහසංඝීය රාජ්‍යයක් ලෙස හඳුන්වන්නේ නාමිකවය. එය වර්තමානය තුළ සංඝීය රාජ්‍යයක් ලෙස හඳුන්වයි. සැබවින්ම ස්විට්සර්ලන්ත සංඝීය ක්‍රමය සුවිශේෂී සංඝීය ක්‍රමයකි.

- **<u>සංඝීය ක්‍රමයක් යනු කුමක්දැයි හඳුන්වන්න.</u>**

සංඝීය ක්‍රමයක් යනු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩුවලට බලතල බෙදා හරින ලද ක්‍රමයකි. ස්විට්සර්ලන්තය තුළ පූර්ණ කැන්ටන 20 ක් ද අර්ධ කැන්ටන 6 ක් ද පවතී. ඒ අනුව ස්විට්සර්ලන්තය ප්‍රාන්ත (කැන්ටන) 26 කින් සැදුම්ලද්දේ වේ.

නිදර්ශන - **යූරී - ස්වයින් - ඇන්ටගෝනන් ,** ඇපන්සන් කැන්ටනයන්ට නිදසුන් වේ. අර්ධ කැන්ටන හේතු 02 ක් නිසා පමණක් පූර්ණ කැන්ටනයකට සමාන නොවේ.

I. රාජ්‍ය සභාවට එක් (01) නියෝජිතයෙකු පමණක් අර්ධ කැන්ටනයකින් තෝරා ගැනීම. පූර්ණ කැන්ටනයකින් දෙදෙනෙක් (02) තෝරා ගනී.

II. ව්‍යවස්ථා සංශෝධනයක දී අර්ධ කැන්ටනයක කැමැත්ත සලකනු ලබන්නේ පූර්ණ කැන්ටනයක අනුමැතියක භාගයක් ලෙසය. ඒ අනුව අර්ධ කැන්ටන 6 යනු පූර්ණ කැන්ටන 03 ක අනුමැතිය ලෙස සටහන් කළ හැකිය.

- **<u>ස්විස්ටර්ලන්ත සංඝීය රාජ්‍යයක් බව පෙන්වා දීම.</u>**

1. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලතල බෙදීම.**

ස්විස්ටර්ලන්තය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මධ්‍ය හා ප්‍රාන්ත ආණ්ඩු වලට බලතල බෙදා තිබේ. ඒ තුළ ජාතික ආරක්ෂාව - විදේශ කටයුතු - ගුවන් තොටුපළ වැනි බලතල - ප්‍රමිතීන් හා මිනුම් නියම කිරීම - වෙඩි බෙහෙත් නිෂ්පාදනය සහ අලෙවිය - මධ්‍යසාර නිෂ්පාදනය පිළිබඳ ඒකාධිකාරය - විවාහ නීති සම්මත කිරීම - යුද්ධය ප්‍රකාශ කිරීම - සාමය ඇති කිරීම - බැංකු කටයුතු සම්බන්ධ නීති - සංඝීය දේපළ පරිපාලනය කිරීම - කාසි නෝට්ටු මුද්‍රණය **<u>මධ්‍ය ආණ්ඩුව</u>** සතු කර තිබේ. සමගාමී බලතල ලැයිස්තුව තුළ කාර්මාන්ත ශාලා - ව්‍යවසාය - රක්ෂණය - පුවත්පත් - අධ්‍යාපනය - මහා මාර්ග වැනි අංශ සතු බලතල දක්වා තිබේ. දක්වා නොමැති **<u>ශේෂ බලතල ප්‍රාන්ත ආණ්ඩු සතු කර තිබේ</u>.**

2. **ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.**

ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථවකි. එහි **පරිච්ඡේද 06 කි. වගන්ති 197 කි.** ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතිම සංඝීය රාජ්‍යයක ප්‍රමුඛ ලක්ෂණයකි.

3. **ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය එකක් වීම.**
**(N.B මෙම තත්ත්වය ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ තුළ දක්වා තිබේ.)**

4. **ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පැවතීම.**

ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායකයේ සංඝීය මහා මණ්ඩලය ද්විමාණ්ඩලික වේ. පළමු සභාව ජාතික සභාව වේ. දෙවැනි සභාව රාජ්‍ය සභාව වේ. රාජ්‍ය සභාව ස්ථාපනය කරනු ලැබුවේ ප්‍රාන්ථ මධ්‍ය ආණ්ඩු තුළ නියෝජනය වීම සඳහාය.

5. **ප්‍රාන්ත ආණ්ඩුවලට සමාන නියෝජනයක් ලබා දීම.**

ප්‍රාන්ත අවශ්‍යතාවය මත ස්ථාපනය කළ රාජ්‍ය සභාව තුළ ප්‍රාන්ත වලට සමාන නියෝජනයක් ලබා දී තිබේ. පූර්ණ කැන්ටනයකින් නියෝජිතයින් (02) දෙදෙනා බැගින් ද , අර්ධ කැන්ටනයකින් එක් (01) නියෝජිතයෙකු බැගින් ද නියෝජිතයින් 46 ක් සිටී.

6. **ද්විත්ව පුරවැසි භාවය.**

ස්විස්ටර්ලන්තයේ සෑම පුරවැසියෙක් ම ස්වකීය ප්‍රාන්තයේ (කැන්ටනයේ) සාමාජිකත්වය මෙන්ම මධ්‍ය ආණ්ඩුවේ සාමාජිකත්වය ලැබිය යුත්තේ ය.

7. **අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය.**

නමුත් සංඝීය විනිශ්චය සභාවට මධ්‍ය ආණ්ඩුවේ සංඝීය මහා මණ්ඩලය සකස් කරන පනත්වල ව්‍යවස්ථානුකුල භාවය පරීක්ෂා කළ නොහැකිය. කැන්ටන සකස් කරන පනත් වල ව්‍යවස්ථානුකුල භාවය පමණක් නිරීක්ෂණය කළ හැක්කේ ය. <u>ව්‍යවස්ථාදායක සංඝීය මහා මණ්ඩලය සකස් කරන පනත් කෙටුම්පත් නිශේධ කිරීමේ බලය ජනතාව සතු ය</u>.

- <u>ස්විස්ටර්ලන්තය සංඝීය ක්‍රමයක් ලෙස නිර්මාණය වීමට බලපෑ හේතු.</u>

1. **භූගෝලීය සාධකය.**

ස්විට්සර්ලන්තය භූමියේ ප්‍රමාණය අතින් ශ්‍රී ලංකාවටත් වඩා කුඩා රාජ්‍යයකි. නමුත් එම භූමිය විෂමතා සහිතය. විශාල කඳුවලින් වටවූ තැනිතලා භූමි ස්විට්සර්ලන්තය පුරාම දක්නට ලැබේ. එම තැනිතලා ප්‍රදේශ කැන්ටනයක් ලෙස හඳුන්වයි. එම කැන්ටන වලට අනෙක් කැන්ටන සමග සම්බන්ධ වීමට මෙම විශාල කඳු බාධකයක් විය. එම නිසා එම තත්ත්වය තුළ වෙනම පාලන ක්‍රමයක් නිර්මාණය කර ගත්තේ ය.

2. **කැන්ටන ජනතාවගේ අවශ්‍යතාවයන්.**

දීර්ඝ කාලයක් ස්වාධීනව ජීවත්වීම නිසා ඒ ඒ කැන්ටන වලට අනන්‍යය වූ සංස්කෘතීන් ගොඩනැගී තිබුණි. එම නිසා ස්වකීය කැන්ටනීය අවශ්‍යතාවයන් කැන්ටනයෙන් කැන්ටනයට වෙනස් විය. ඒ අනුව එම තත්වයන්ට ගැලපෙන ලෙස පාලනය කිරීමට සංඝීය ක්‍රමයක් ස්ථාපනය කිරීම.

ස්විට්සර්ලන්තයේ ප්‍රාන්ත ස්වාධීනත්වයක් භුක්ති විඳී. කැන්ටන වල අනුමැතියකින් තොරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට නොහැකිය.

## ප ක්ෂ ක්‍රමය

- **පක්ෂ ක්‍රමය හැඳින්වීම.**

ස්විට්සර්ලන්ත පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයකි. ඒ අනුව ස්විට්සර්ලන්තය තුළ ප්‍රධාන දේශපාලන පක්ෂ කිහිපයක් හඳුනාගත හැකිය. මෙම පක්ෂ ක්‍රමය ලෝකයේ අනෙක් රටවලට ද ආදර්ශයට ගත හැකි පක්ෂ ක්‍රමයකි. ස්විස් දේශපාලන පක්ෂ බිහිවන්නේ 1848 දී හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමගිනි.

නිදර්ශන -: ස්විස් මහජන පක්ෂය
රැඩිකල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
ලිබරල් පක්ෂය
කතෝලික කොන්සවේටිව් පක්ෂය
ගොවි පක්ෂය
සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
කොමියුනිස්ට් පක්ෂය
හරිත පක්ෂය

- **ස්විට්සර්ලන්ත පක්ෂ ක්‍රමයේ ලක්ෂණ.**

ස්විට්සර්ලන්ත දේශපාලන පක්ෂ වල ලක්ෂණ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම ඉතාමත්ම වැදගත් වේ. ඒ මන්ද යත් , එය ලෝක දේශපාලන තුළ දෘශ්‍යමානව පවතින ආදර්ශමත් ම පක්ෂ ක්‍රමය වීමයි.

1. දිගුකාලයක් තිස්සේ කිසිදු වැදගත් ප්‍රශ්නයක් එම පක්ෂ වෙත ඉදිරිපත් කර නොතිබීම.

වසර පනහකටත් වැඩි කාලයක් තිස්සේ ස්විට්සර්ලන්තයට වෙනත් යුරෝපීය රාජ්‍යයන්ට මුහුණ දීමට සිදු වූ දේශපාලනමය ප්‍රශ්නයකට මුහුණ පෑමට සිදු වූයේ නැත. එම නිසා ඒ රට දේශපාලඥයින්ට පක්ෂවල විශේෂිත ප්‍රශ්න සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ අවකාශය එරට පාරිසරික සාධක තුළින් උත්පාද කළේ නැත.

2. ආර්ථික තත්වය පිළිබඳව අප්‍රාසාදයක් නොතිබීම.

රාජ්‍යය තුළ ආර්ථික අර්බුදය උග්‍රවන විට පක්ෂ උද්යෝගය තීව්‍ර වේ. ස්විස් ජනතාව පවතින ආර්ථික තත්ත්වයන් පිළිබඳව අසතුටට පත්ව ඇති සේයාවක් නොපෙනේ.

3. ආගමික විරෝධයක් නොපැවතීම.

ආගමික මතවාද මගින් දේශපාලන ක්‍රමය දේශපාලන පක්ෂ කුළුගැන්විය හැකිය. නමුත් ස්විට්සර්ලන්තය තුළ ආගමික සමානාත්මතාවය ක්‍රියාත්මක වේ. බහු ආගමික රාජ්‍යයක් වන ස්විස්ටර්ලන්තය තුළ ආගමික මතවාද මත දේශපාලන පක්ෂ කුළුගැන්වීමක් නොමැත.

4. ස්විස් විධායකයේ ස්වභාවය.

ස්විස් විධායකය සංඝීය කවුන්සිලය එක් පක්ෂයක සාමාජිකයන් ගෙන් සකස් වූවක් නොවේ. එහි සාමාජිකත්වය ලැබීම සඳහා ව්‍යවස්ථාදායකයේ බහුතර ආසන සංඛ්‍යාවක් අවශ්‍ය නොවේ. මේ තත්ත්වය මත විධායකයට තේරීපත්වීමට දේශපාලන පක්ෂ අතර තරඟයක් නොමැත. එම නිසා නිහඬ පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

5. නොදැඩි පක්ෂ සංවිධානය.

ස්විස් දේශපලන පක්ෂ දැඩි ප්‍රතිපත්ති මත සංවිධානය කර නොමැත. ඒවා සංවිධානය වී ඇත්තේ ජාතික පදනමට වඩා කැන්ටනීය පදනමකිනි.

6. පෞද්ගලික උන්නතිකාමය ප්‍රකට කමින් අඩු විම.

පෞද්ගලික උන්නතිකාමය හා පෞද්ගලික නායකත්වය සම්බන්ධ උවමනාව අඩුම රාජ්‍යය ස්විස්ටර්ලන්තය ලෙස ප්‍රකාශ කළ හැකිය. ස්විස් ජනතාව ගරු කරනුයේ හැකියාව, දක්ෂතාවය, උපාය කෞශල්‍යය , අවංක භාවය මිස පෞරුෂත්වයට නොවේ. පෞද්ගලික ප්‍රයෝජන තකන අධි උන්නතිකාමී අවස්ථාවාදී නායකයන්ට ස්විට්සර්ලනතය තුළ පිළිගැනීමක් නැත.

7. ජයග්‍රාහී හැඟීමෙන් තොරවීම.

දේශපාලන සම්බන්ධයෙන් ජයග්‍රාහී හැඟීමක් ස්විස් වැසියා තුළ නොමැත. ඔවුන් දේශපාලන සලකනුයේ රාජකාරියක් ලෙසිනි.

8. ජන සම්මත ඡන්දය.

වැදගත් ප්‍රතිපත්තිමය තීරණ ගනු ලබන්නේ ජන විචාරණය (ජනමත විචාරණය) තුළිනි. එම නිසා දේශපාන පක්ෂ ව්‍යවස්ථාදායකය තුළ හෝ විධායකය තුළ ආධිපත්‍යයක් දැරීමට උත්සාහ නොගනී. ඒ අනුව දරුණු පක්ෂ ගැටුම්වලට මුල්වන එළඹුම් ස්විට්සර්ලන්තය තුළ දක්නට නොලැබේ.

9. පන්ති භේද නැති බව.

ස්විස්ටර්ලන්තයේ ආදායම් අසමානතා පැවතිය ද අනෙකා කුපිත කරවන අන්දමේ ධනවත් භාවය ප්‍රදර්ශනය කිරීමේ හෝ නොපොහොසත් භාවය ආන්තිකරණයට ලක්කිරීමේ ක්‍රියාවලියක් දක්නට නැත.

10. වැඩි බෙදා ගැනීම් ක්‍රමයක් (කොල්ලකෑමේ ක්‍රමයක්) නැති බව.

ස්විට්සර්ලන්තයේ ඒ ඒ නිලතල වලට පුද්ගලයන් පත් කරනු ලබන්නේ කුසලතාවය, දක්ෂතාවය, නිපුන භාවය, උපාය කෞෂල්‍යය වැනි මූලධර්ම මතය. එම නිසා බලකාමී පාලකයන් උත්පාද නොවේ.

11. දේශානුරාගය.

ස්විට්සර්ලන්ත පුරවැසියන් හදපත්ලෙන් දේශවාත්සල්‍යයෙන් යුක්ත වෙති. ඔවුන් ජාතියේ යහපතට මුල්තැන දෙති.

12. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම භාවිතය නිසා පක්ෂ වල වැදගත් කම අඩුවීම.

ප්‍රාරම්භය - පුනරාවර්ථනය වැනි ජනතාව සෘජුව පාලන කටයුතු වලට සම්බන්ධ වන උපක්‍රම භාවිතා කිරීම නිසා පක්ෂවල වැදගත් කම අඩු වී තිබේ.